# මාරස්සන අම්බලම හා ඒ හා බැඳි නස්පර්ශිත උරුමය

ආර්. එම්. එන්. එස්. කේ. රණතුංග

පුරාවිද්‍යා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

---

මධ්‍යකාලීන යුගයේ ජනප්‍රිය වූ සුවිශේෂී වාස්තුවිද්‍යාක්මක අංගයක් ලෙස අම්බලම් සැලකිය හැකි ය. ඒ ආශ්‍රිත මූලික මෙන්ම ද්විතික නිර්මිත පරිසර තත්ත්වයන් පෙන්නුම් කෙරේ. බොහෝ විට පැරණි මාර්ග ජාල හා සම්බන්ධ වන මේවා ග්‍රාමීය ජනවාසයන්ට ද සමීපව ස්ථානගත වෙයි. මෙහිදී විශේෂ අවධානයට ලක්කෙරෙන මාරස්සන අම්බලම ද එවැන්නකි. මෙය මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාරස්සන ග්‍රාමසේවා වසමට අයත්ව පිහිටා තිබේ. යටත් පිරිසෙන් 18 හෝ 19 සියවස්වලට අයත් වාස්තු විද්‍යාත්මක සැලසුමක් ප්‍රකට කරන මෙය ජනප්‍රවාද තොරතුරු අනුව මීට වසර 150කට පමණ පෙර ඉදිවූවකි. ආයත චතුරස්‍රාකාර හැඩයක් ගනු ලබන මෙහි පිටත සැලැස්ම අඩි 6 අගල් 20කින් ද ඇතුළත බරාදය අඩි 4 අගල් 17 කින්ද විශාලත්වයෙන් යුක්ත ය. ගල් කුට්ටි 8 ක් මත දැව අතුරා නිර්මාණය කර ඇති මෙය දැව කණු 14 ක් මත ඉදිවූවකි. දැව කණු ආශ්‍රිත ව තත් යුගයට අයත් අලංකරණ සම්ප්‍රදායක් දැකගත හැකි ය. තව ද මෙහි වන විශේෂත්වයක් ලෙසයට ලී කුරුපා රහිතව පරාල එකිනෙකට සම්බන්ධ කර ඇති කැණිඩලේ මඩොල් කුරුපාවක් දක්නට ලැබීම සැලකිය හැකි ය.

මෙම අම්බලම සෙසු අම්බලම්වලින් විශේෂවීම කෙරෙහි ඒ හා බැඳි සමාජීය ක්‍රියාකාරකම් අභිචාර විධින් පැවතීම හේතු විය. විශේෂයෙන් කෘෂිකාර්මික කටයුතු සාකච්ඡා කිරීම ආදී ද මේ ආශ්‍රිතව සිදුවිය. මානවවංශ දත්ත අනුව මේ ආශ්‍රිත ක්‍රියාකාරකම් සමාජස්තරායනය මත පදනම්ව තිබිණි. අද්‍යතනය වනවිට ඒවා වියැකී ගොස් ඇතැත් වාර්ෂික කිරිපිඩු දානය වැනි අභිචාර විධින් මෙය කේන්ද්‍රකොටගෙන ක්‍රියාත්මක විය. මෙම අම්බලමේ අපරිභාගයේ තබා තිබෙන රන්සිවිගෙය සහිත දෝලාව විශේෂිත පැරණි නිර්මිතයකි. 1940 පමණ වන විද මෙය වාර්ෂික දාන ආදී කටයුතු සඳහා භාවිතා කළ බව කියැවෙයි. අෂ්ටාස්‍රාකාර හැඩයෙන් යුතු මෙහි දිවාර 4 කි.

ඉහත කී සමාජයීය සංස්කෘතික අංගයන්ගෙන් යුක්ත මෙම අම්බලමේ ඓතිහාසික හා නස්පර්ශිත වැදගත්කම නිසි පරිදි අවධාරණය වීම මෙතෙක් සිදු වී නොමැති හෙයින් ඒ ආශ්‍රිතව තවදුරටත් සාකච්ඡා කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පද : මාරස්සන අම්බලම, සමාජීය ක්‍රියාකාරකම්